1832

මගේ අංකය:-24/03/03
නේවාසික ව්‍යාපාර කළමනාකරු,
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
නාච්චාදූව ව්‍යාපාරය
2019-03- 08

17 APR 2019

ව්‍යාපාර කමිටුවේ සියළුම
සාමාජික මහත්ම මහත්මීන් වෙත,

## 2019 – මාර්තු මස 07 වෙනි දින ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

නාච්චාදූව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2019/03/07 දින පෙ.ව 9.00 ට ව්‍යාපාර කළමනාකරන කමිටු රැස්වීම් පවත්වන ලදී. පැමිණ සිටි සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යා ය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

සහභාගිත්වය:-රජයේනිළධාරින්

| | | | |
|---|---|---|---|
| 1.එච්.එම්. එස්.බී හේරත් මයා | නේ/ව්‍යා/කළමනාකරු | නාච්චාදූව | ව්‍යාපාරය |
| 2.එස්.කේ ඉලංගසිංහ මිය | ප්‍රා: වා: ඉංජිනේරු | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |
| 3.එස්.එච්.ටී.යූ නයනකාන්ති මිය | කොට්ඨාශ සහකාර | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |
| 4.පී.පී.කේ.එල් පතිරගේ මිය | සංවර්ධන නිළධාරි | නාච්චාදූව නේවා/ව්‍යා/ | කාර්යාලය |
| 5.බී.පී.එල් ප්‍රියානි මිය | සංවර්ධන නිළධාරි | නාච්චාදූව නේවා/ව්‍යා/ | කාර්යාලය |
| 6.ජ්.ජී.එම්.සී.එම් ප්‍රේමචන්ද්‍ර මයා | සංවර්ධන නිළධාරි | - එම | - |
| 7.ජ්.පී.ටී.පී ජයවර්ධන මිය | සංවර්ධනනිළධාරි | ප්‍රාදේශීය ලේකම් | කාර්යාලය |
| 8.එම්.එම්.එම් උදයංග මයා | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |
| 9.ජ්.එම් තිලකරත්න මයා | ජලපාලක | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |
| 10.වී.එම් රණසිංහ මයා | ජලපාලක | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |
| 11.ඩබ්.එම් ගුණරත්න මයා | ජලපාලක | වාරිමාර්ග | දෙපාර්තුමේන්තුව |

සහභාගිත්වය :- ගොවි සංවිධාන නිලධාරින්

| | | |
|---|---|---|
| 1 .ටී.බී හේරත් මයා | මහසෙන් | ලේකම් |
| 2. ආර්.ජ්. ඩී ප්‍රේමචන්ද්‍ර මයා | ගැමුණු | සභාපති |
| 3.ඩී.ටී.එම් පුංචිබංඩා මයා | රුවන්වැලි | සභාපති |
| 4.ආර්.එම් ලලිත් පියසේන මයා | පරාක්‍රම | සභාපති |
| 5.එච්.ජ් චන්ද්‍රරත්න මයා | 26/27 | සභාපති |
| 6.එච්.පී මල්කාන්ති මිය | මහසෙන්/ඒකාබද්ධ | භාණ්ඩාගාරික |
| 7.ඩී ප්‍රේමචන්ද්‍ර මයා | සේනසමගි | භාණ්ඩාගාරික |
| 8.එම්.ජ් එම් මුස්තපා මයා | විජය | සභාපති |
| 9.ජ්.එම් අබේසිංහ මයා | පරාක්‍රම | ලේකම් |
| 10.එන්.පී.එන් ගුනරත්න මයා | ඉසුරු | සභාපති |
| 11.එච්.එම් අචිනි ශිරෝනිමා මිය | රන්කෙත/විජය | භාණ්ඩාගාරික /ලේකම් |
| 12.වයි.ජී.පියරත්න මයා | එක්සත් | සබාපති |

1.පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම.

පලමුව ආගම සිහි කිරීමෙන් පසු නේවාසික ව්‍යාපාර කලමනාකාරතුමා සියලුම දෙනා පිලිගනිමින් අනතුරුව න්‍යායපත්‍රානුකූලව රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

2.පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය වාර්තාවේ අඩුපාඩු නොමැති බැවින් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

3.ලැබී ඇති ලිපි

1. ප්‍රධාන ජලාශ ආශ්‍රිතව කරනු ලබන මහා පිරිත් සංඥායනාව 2019-03-15 දින දිප ව්‍යාප්ත අන්දමින් පවත්වනු ලබන අතර එහි ජාතික උත්සවය අනුරාධපුර අභය වැවෙහි ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වෙන බව දැනුවත් කිරීම - මේ සඳහා සියළුම ගොවි සංවිධාන සාමාජිකයන්ගේ , රජයේ නිලධාරින්ගේ සහයෝගය අවශ්‍ය බව දැනුවත් කිරීම වාරිමාර්ග දෙපාර්තුමෙන්තුව මගින් යොමු කරන ලද ලිපිය

2.ගොවීන් විසින් දේශීය බඩ ඉරිගු අලෙවි කිරිම - වාරිමාර්ග කලමනාකරන අංශය මගින් යොමු කරන ලද ලිපිය

3.ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය - වාරිමාර්ග කලමනාකරන අංශය මගින් යොමු කරන ලද ලිපිය

4. අතිරේක ආහාර බෝග ආනයනය සීමා කිරීමට හා අපනයනය කිරීමට අවශ්‍ය ඉල්ලුම ඇති බෝග වාණිජ වශයෙන් වගා කිරීමට කඩිනමින් සැලැස්මක් පිළියෙල කර ගැනීම - වාරිමාර්ග කලමනාකරන අංශය මගින් යොමු කරන ලද ලිපිය

6.සිරි දළදා යල් අස්වනු පූජාව - 2019 සමගාමීව පැවැත්වෙන බක්මහේ අගසස් පූජා මංගල්‍යය සඳහා අගසස් එකතු කිරිම - වාරිමාර්ග කලමනාකරණ අංශය මගින් යොමු කරන ලද ලිපිය

4.ආයතන සංවර්ධන කටයුතු - බී.පී.එල් ප්‍රියානි මිය - සංවර්ධන නිළධාරි

4.1 කාරක සභා , මහසභා , නිළවරණ පැවැත්වීම්

| කාරණය | ප්‍රගතිය | වෙනත්(පවත්වා නැත) |
|---|---|---|
| කාරක සභා පැවැත්විම | අල්අක්ෂා , විජය, රුවන්වැලි ,එක්සත්, ඒකාබද්ධ ,සේනසමගි, ඉසුරු, පරාක්‍රම, රංකෙත, තිස්ස | මහසෙන්,26/27 ගැමුණු,රණමයූර නවෝදා, |
| මහ සභා පැවැත්විම | නැත | |
| නිලවරණ මහසභා පැවැත්විම | නැත | |

4.2 මුදල් සාරාංශ ලබා දීම්

| ගොවි සංවිධානය | මුදල් සාරාංශ ලබා දීම් |
|---|---|
| රංකෙත, සේනසමගි | 2019 -02-28 දක්වා |
| මහසෙන්, රුවන්වැලි, ඒකාබද්ධ ගොවි සංවිධානය, අල්අක්ෂා, විජය , සේනසමගි, රණමයූර තිස්ස, එක්සත්, ගැමුණු,26/27, නවෝදා, ඉසුරු , පරාක්‍රම | 2019 -01-31 දක්වා |

| | |
|---|---|
| ඒකාබද්ධ ගොවි සංවිධානය | 2018-12-31 දක්වා |
| ගැමුණු ගොවි සංවිධානය නොවැම්බර් වලින් පසු ලබා දී නැත. | - |

## 4.3 බාහිර විගණනය කිරිම - 2018 වර්ෂය සදහා

| ගොවි සංවිධානය | විගණනය කිරිම |
|---|---|
| 1. 26/27 | |
| 2. රංකෙත | විගණනය කර ඇත. |
| 3. විජය | -එම- |
| 4. ගැමුණු | -එම- |
| 5. තිස්ස , | විගණනය කර නැත මේ වන විට ලිඛිතව දැනුම් දී ඇත. |
| 6. ඒකාබද්ධ | -එම- |
| 7. අල්අක්ෂා | -එම- |
| 8. පරාක්‍රම | විගණනයට බාර දී ඇත |
| 9. නාවෝද | -එම- |
| 10. රණමයුර | -එම- |
| 11. එක්සත් | -එම- |
| 12. මහසෙන් | -එම- |
| 13. ඉසුරු | -එම- |
| 14. රුවන්වැලි | -එම- |
| 15. සේනසමගි | -එම- |
| | -එම- |

අනිකුත් ගොවි සංවිධාන බාහිර විගණනය සදහා මෙම මස ඇතුලත ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

## 4.4 මහ සභා පැවැත්වීම්

| ගොවි සංවිධානය | මහ සභා දින වකවානු |
|---|---|
| 1. 26/27 | 2019 මාර්තු 28 |
| 2. රංකෙත | 2019 අප්‍රේල් 01 |
| 3. විජය | 2019 මාර්තු 26 |
| 4. සේනසමගි | 2019 මාර්තු 29 |
| 5. එක්සත් | 2019 අප්‍රේල් 05 |

ගොවි සංවිධාන කිහිපයක මහ සභා දින වකවානු වෙන් කර ගත් අතර මෙම දින වකවානු ඉදිරියේදී සංශෝධනය විය හැකි බවත් දැනුවත් කරන ලදී.

| ඉදිරිපත් කල අය | කාරණය | තීරණය | වගකීම | තීරණය ක්‍රියාත්මක කිරිම සඳහා ගත වන කාලය |
|---|---|---|---|---|
| 26/27 ගොවි සංවිධාන ගරු සභාපතිතුමා :- | නඩත්තු මුදල් නොගෙවූ ගොවි නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම්ට ඉදිරිපත් කර | | | |

| | | | | |
|---|---|---|---|---|
| . | ලිඛිතව දැනුවත් කිරීමෙන් අනතුරුව නඩත්තු මුදල් නොගෙවූ පිරිස ගෙවීම් කටයුතු සදහා යොමුවීම වැදගත් කාරණාවක් බව පෙන්වා දෙන ලදී. | | | |
| 1.රංකෙත ගොවි සංවිධාන ගරු භාණ්ඩාගාරිකතුමිය | කුඩා නෙළුබැව වැවේ සොරොව්ව කඩා ලැල්ල ඉවත් කර ජලය ලබා ගෙන ඇති අතර අනවසරයෙන් වගා කරන කොටස සදහා මෙලෙස ජලය ලබාගෙන ඇත. | මෙහිදි අනවසරයෙන් මෙ කුඹුරු වගා කරන බවට ලිඛිතව දැනුවත් කරන ලෙසත් පලමුව පොලිසියට පැමිනිල්ලක් ඉදිරිපත්කල යුතු බවටත් සාකච්චා විය. | වාරිමාර්ග දෙපාර්තුමේන්තුව | |
| තිස්ස ගොවි සංවිධාන ගරු සභාපතිතුමා පුංචිරාල මහතා | ආමනෝ වැවේ සොරොව්ව කඩා ඇති අතර අක්කර 60 ක් පමන අස්වැන්න යටවී ඇති බවටත් වාරිපුබුදු ව්‍යාපෘතිය තුල ආමනෝ පස් ඉවත් කරද්දි කුනු ඇලේ අයින දිග අඩි 08 ක පාරක් දමා ඇත. එම කුණු ඇල කපා පාරට බොරළු දමන ලෙස ඉල්ලීමක් කරන ලදී. මෙනි එක් ගොවියෙකු පාර සෑදීමට අවසර නොදෙන අතර පාර ග්‍රෙවල් දමා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | . | වාරිමාර්ග දෙපාර්තුමේන්තුව | |

5.ගොවිසංවිධානනිළධාරින්ගේඅදහස් :-

පරක්‍රම ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා :- තුරුවිල කොටසේ වෙනම ගොවි සංවිධානයක් සාදා ගැනීම සම්බන්ධව සාකච්ඡා කරනු ලැබූ අතර ඔවුන්ට ඒ සදහා අවසර ලබා දෙන ලෙසඉල්ලාසිටිනලදී.

14 දෙනෙකුගෙන් පස් දෙනෙක් පමනක් ජලය අවශ්‍ය බවට ඉල්ලීම් කරන ලද අතර එහි වගකීම ගොවිසංවිධානයටබාරගැනීමටසිදුවනබවද්‍රප්‍රකාශකරසිටිනලදී.

<u>ඒකාබද්ධ ගොවි සංවිධාන ගරු සභාපතිතුමා</u> :-යල් අස්වනු පූජාව පැවැත්වීම සඳහා අනුරාධපුර උඩ මළුව වඩාත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී. යල් අස්වනු පූජාවට සහභාගිවීමට ඇති බැවින් බක් පූජාවට සහභාගි වීමට නොහැකි බවට ගොවි සංවිධාන නිලධාරින්ගේ සාකච්ඡාවට බඳුන් වූ අතර ඉල්ලීමක් තිබූ බැවින් නේවාසික ව්‍යාපාර කලමනාකාරුතුමා ප්‍රකාශ කල ඒ බව ලිඛිත ව ලබා දෙන ලෙසයි.

<u>6.ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු එස්.කේ ඉලංගසිංහ මිය -- වාරිමාර්ග දෙපාර්තුමේන්තුව</u>

ජලතත්වය :- අඩි 22 අගල් 10

දීප ව්‍යාප්ත මට්ටමින් 2019-03-15 දින පැවැත්වෙන පිරිත් පිංකමේ ගොවි සංවිධාන සඳහා පිරිත් මණ්ඩපය සැකසීම සඳහා වෙන් කර දී ඇති බවත් වැව මැද පිරිත් කොටුව සෑදීම සඳහා හාමුදුරුවන් උපදෙස් ලබා දුන් බවත් වාරිමාර්ග ඉංජිනේරුතුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගොවි සංවිධාන නිළධාරින්ගේ අදහස වූයේ වැව මැද පිරිත් කොටුව සෑදීම ප්‍රායෝගික නැති බවත් එය වැව ආසන්නයේ සැකසීම කලහැකි බවත්ය.

හීල් දානය සකසා ගැනීම සඳහා රසකැවිලි හා ආහාර පාන ගොවි සංවිධාන හරහා බාර ගන්නා ලදී.

<u>අල්අක්ෂා ගොවි සංවිධානය - ලේකම් මහතා</u>

අතිරේක වතුර මුරයක් ලබා දෙන ලෙස අල්අක්සා ලේකම්තුමා ඉල්ලීමක් කරන ලද අතර , මෙම ඉල්ලීම ලිඛිතව ලබා දෙන ලෙස නේවාසික ව්‍යාපාර කලමනාකාරතුමා විසින් ඉල්ලා සිටින ලදී.

<u>පරාක්‍රම ගොවි සංවිධාන ගරු සභාපති ලලිත් මහතා</u>

පෙර කන්න තීන්දු තීරණ වලට අනුව ජල මුර ලබා දීම නැවත සිදු නොකල හැකි බවත් , ඉඹි යතුරුකඩා දැමීම මේ වන විටත් සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

කමිටු තීරණයක් ලෙස ජල මුර දීර්ඝ නොකිරීමට සාකච්ඡා කර ගන්නා ලද අතර මෙහිදී නේවාසික ව්‍යාපාර කලමනාකාරතුමාගේද අදහස වූයේ හීන් ඇලේ ගොවීන් ජලය ඉල්ලීම හේතු සහගත නොවන බවත් කිසිදු හේතුවක් මත ජලය ඉල්ලීම නොකරන ලෙසත්ය.

<u>එක්සත් ගොවි සංවිධාන ගරු සභාපතිතුමා</u>

නඩත්තු මුදල් ලබා නොදුන් පිරිසගේ සමාජිකත්වය අහෝසි කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දැනුවත් කරද එය ප්‍රායෝගිකව කිරීම අපහසු බව පැහැදිලි කරන ලදී.

<u>7. ආර්.පී.එම් දිසානායක මහතා - අතිරේක අධ්‍යක්ෂ - වාරිමාර්ග කලමනාකරණ අංශය</u>

ගොවි සංවිධානවල නිළදාරින් සමග ව්‍යාපාර කමිටුවේ අවශ්‍ය තීරණ ලබා ගන්නා අතර ඉසුරු ලියදු විශාල කොට සංවර්ධනය කිරීමේ වැඩ සටහනට පැමිණි බවත් මෙය ලංකාවට වඩාත් ගැලපෙන ක්‍රමයක් ලෙස සකස් කර ගන්නේ කෙසේද යන්න සාකච්ඡාවට ගත යුතු බවත් එහි මූලික අදියර ආරම්භ කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව ද ප්‍රකාශ කරන ලදී.

හෙක් 26 ක ප්‍රමාණයක වුවත් නාච්චාදූව ව්‍යාපාරය තුල මෙම වැඩ සටහන ව්‍යාප්ත කිරීම සඳහා ඔබගේසහයෝගය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 2019 වර්ෂය තුල පැවැත්වූ ගොවි සංවිධාන තරගාවලිය සම්බන්ධව

ගොවි සංවිධාන නිලධාරින්ගේ අදහස් විමසීමක් ද කරන ලදී.

රුවන්වැලි ගොවි සංවිධානයේ ගරු සභාපති ඩී.වී.එම් පුංචිබණ්ඩා මහතා

ගොවි සංවිධාන තරගාවලිය වාර්ෂිකව කරනවානම් අප සංවිධානයේ අඩුපාඩු හදුනා ගැනීමට හැකි වන අතර , ආයතනය සමග සාකච්ඡා කොට කෘෂිකාර්මික මට්ටමින් අපෙන් සිදුවන අඩුපාඩු මගහරවා ගැනීමට උපකාරි වේ. ඒ සදහා මෙම තරගාවලිය ඉතා වැදගත් වන අතර , මෙම තරගාවලිය පැවැත්වීමට සහයෝගය දැක්වූ සියළු දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන ලදී.

අතිරේක අධ්‍යක්ෂ ආර්. පී. එම් දිසානායක මහතා ප්‍රකාශ කලේ මේ වන විට ගොවි සංවිධානය දියුණු තත්වයකට පත්ව ඇති බවත් ලංකාවේ ගොවි සංවිධාන 888 ක් වර්ගීකරණය ට යටත් වන බවත් , ඒ කාණ්ඩයේ ගොවි සංවිධානයක් බවට පත් කිරිම සදහා ඔබ කටයුතු කල යුතු බවකි.

සොබා උද්‍යානයේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යන ලෙසත් , ව්‍යාපාර ගොවි සංවිධාන තව දුරටත් ශක්තිමත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගොවිජන සේවා දෙපාර්තුමේන්තුව

සහභාගිවිනොමැත

කෘෂිකර්ම දෙපර්තුමේන්තුව

සහභාගිවිනොමැත

ප්‍රාදේශීයලේකම්කාර්යාලය - නාච්චාදූව

සහභාගිවිනොමැත

ඉන්පසු ව්‍යාපාර කලමනාකරණ කමිටුවේ ලේකම්ගේ ස්තූති කතාවෙන් පසුව 12.30 ට පමණ ව්‍යාපාර කලමනාකරණ කමිටුවේ වැඩ කටයුතු අවසන් විය .

.................... ....................

සභාපති ලේකම්

ව්‍යාපාර කලමනාකරණ කමිටුව

පිටපත්:-

1. අධ්‍යක්ෂ, - වාරිමාර්ග කලමනාකරණ අංශය
2. අධ්‍යක්ෂ, (වත්කම් කලමනාකරණ) වාරිමාර්ග දෙපාර්තුමේන්තුව
3. දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුර
4. ප්‍රාදේශීය ලේකම් - නාච්චාදූව
5. වාරිමාර්ග අධ්‍යක්ෂ - අනුරාධපුර
6. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් -අනුරාධපුර
7. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - නාච්චාදූව
8. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පලාත්) - අනුරාධපුර
9. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - ශ්‍රාවස්තිපුර
10. ගොවිජන සංවර්ධන නිළධාරි -ශ්‍රාවස්තිපුර
11. පශු වෛද්‍ය නිලධාරි - ශ්‍රාවස්තිපුර
12. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - අ/පුර